# රැකියා පුරප්පාඩු

## ප්‍රධාන විධායක නිලධාරී තනතුර

## සී/ස කුරුණෑගල වැවිලි සමාගම

### (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය)

ශ්‍රී ලංකාවේ වැවිලි අංශයේ ප්‍රමුඛතම රජය සතු ව්‍යවසායයක් වන සී/ස කුරුණෑගල වැවිලි සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ප්‍රධාන විධායක නිලධාරී ලෙස තෝරාගනු ලබන අපේක්ෂකයා දූරදර්ශී, කාර්යශූර හා දක්ෂ වෘත්තිකයෙකු විය යුතු අතර, සමාගමේ තිරසාර වර්ධනය සහ ලාභදායීත්වය සහතික කිරීම සඳහා උපායමාර්ගික මග පෙන්වීම, ඵලදායී නායකත්වය සහ මනා කළමනාකරණයක් සැපයීම් සඳහා වගකීමට බැඳී සිටියි.

**ප්‍රධාන වගකීම්**

- සමාගමේ කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා දූරදර්ශී නායකත්වයක් ලබාදීම සහ දිගුකාලීන උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම,
- සමාගමේ සියලුම මෙහෙයුම් හා මූල්‍ය කටයුතු අධීක්ෂණය කිරීම.
- කුරුණෑගල වැවිලි සමාගම විසින් කළමනාකරණය කරනු ලබන පොල්, රබර්, තේ ඇතුළු අනෙකුත් වැවිලි බෝග, කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන ක්‍රියාකාරකම්වල තිරසාරභාවය සහ ඵලදායීතාවය සහතික කිරීම.
- නවෝත්පාදනය, විනිවිදභාවය සහ යහපාලනය පිළිබඳ සංස්කෘතිය පෝෂණය කිරීම.

**සුදුසුකම් හා පළපුරුද්ද**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිළිගත් විශ්වවිද්‍යාලයක කෘෂිකර්මය/විද්‍යාව/ව්‍යාපාර කළමනාකරණය හෝ ඒ හා සමාන ක්ෂේත්‍රයක උපාධියක් සමඟ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් සම්පූර්ණ කර තිබීම හෝ කළමනාකරණය පිළිබඳ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (Professional Charted Institution) ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership).

**සහ**

ප්‍රථම උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක ඉහළ කාර්යසාධනයක් සහිතව විධායක ශ්‍රේණියේ වසර 18 කට නොඅඩු පළපුරුද්ද හා ඉන් වසර 05 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද

**සමග**

- පොල් නිෂ්පාදනය, සැකසීම සහ පොල් වතු කළමනාකරණය පිළිබඳ නිපුණතාවය
- විවිධ මට්ටමේ කණ්ඩායම්, මානව සහ අනෙකුත් සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට ඇති හැකියාව

**වයස**

වයස අවුරුදු 35 නොඅඩු සහ 55 නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා බල නොපානු ඇත.

**වැටුප්**

තෝරාගනු ලබන අයදුම්කරු පහත වැටුප් ව්‍යුහය යටතේ සේවයට අනුයුක්ත කරනු ඇත. HM-2-1 2025 රු. [161,140 - 12 X 4,850 - 219,340] + ජීවන වියදම් දීමනාව හා තනතුරට අදාළ අනෙකුත් වරප්‍රසාද සඳහා හිමිකම් ලබනු ඇත.

අයදුම්කරු ගැන විමසීම් කළ හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක අයදුම්පතෙහි සඳහන් කර අදාළ සහතිකවල පිටපත්ද සමඟ **"සී/ස කුරුණෑගල වැවිලි සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය"** යනුවෙන් ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ පැහැදිලිව සඳහන් කර පහත ලිපිනයට 2026 මාර්තු 16 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය.

රාජ්‍ය ආයතනවල දෙපාර්තමේන්තු හෝ මණ්ඩලවල සේවයේ නියුක්ත වූවන් මේ සඳහා අයදුම් කරන්නේ නම් අදාළ ආයතන ප්‍රධානියාගේ අනුමැතිය සහිතව අයදුම් කළ යුතුය. ඍජුව තාවකාලික අයදුම්පතක් (Advance Copy) යොමු කළ හැකිය.

බඳවා ගැනීම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම නුසුදුසුකමක් සේ සැලකීමට හේතුවක් වනු ඇත.

**සභාපති,**
**සී/ස කුරුණෑගල වැවිලි සමාගම,**
**නො.80, දඹුල්ල පාර, කුරුණෑගල.**
**දු.ක - 037 2223133**
**2026.03.01**